# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1877/69 - 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2014.08.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පැපිලියාන සුනේත්‍රාදේවී රජමහා විහාර පූජනීය ප්‍රදේශය පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

අංක 1681/3 හා 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා අති විශෙෂ ගැසට් පත්‍රයේ
පළ කරන ලද නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1681/3 - 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා ප්‍රසිද්ධ කරන ලද අතිවිශෙෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ආචාර්ය දිසානායක මුදියන්සේලාගේ ජයරත්න වන මා හට පැවරී ඇති පූජාභූමි සැලසුම්කරණය හා සංවර්ධනය විෂයය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය ''පැපිලියාන සුනේත්‍රාදේවී රජමහා විහාර පූජාභූමිය'' යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය දි.මු. ජයරත්න,
බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

*උපලේඛනය*

***පැපිලියාන සුනේත්‍රාදේවී රජමහා විහාර පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

මිනින්දෝරු ජනරාල්ගේ 2010 නොවැම්බර් මස 10 වැනි දින මූලික පිඹුරු අංක මු.පි.කො. 9122 දරන සැලසුමේ කැබලි අංක 1 ලෙස නිරූපිත බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ,කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේ පත්තුව සුළු කොට්ඨාසයේ, පැපිලියාන ග්‍රාමයේ පිහිටි හෙක්ටයාර් 1.3749 ක විශාලත්වයෙන් යුතු පහත දැක්වෙන පරිදි මායිම් වූ මුළු ප්‍රදේශය.

| | |
|---|---|
| උතුරට | : අරලිය ගාඩ්න්ස් හි වරිපනම් අංක 30/15, 30/14, 30/13,30/12 හිමිකරු සහ වරිපනම් අංක සොයාගත නොහැකි ඉඩම, ඇළ සහ දෙහිවල පාරේ වරිපනම් අංක 26/12 සහ 26/11 දරන ඉඩම් ; |
| නැගෙනහිරට | : දෙහිවල පාරේ වරිපනම් අංක 26/12, 26/11, 26/10, 26/9, 26/8, 26/7, 26/6, 26/5, 26/4, 26/3, 26/2, 26/1 සහ 26 සහ දෙහිවල පැපිලියාන මහා මාර්ගය ; |
| දකුණට | : දෙහිවල පැපිලියාන මහා මාර්ගය ; |
| බස්නාහිරට | : අරලිය ගාඩ්න්ස් පාර අරලිය ගාඩ්න්ස් හි වරිපනම් අංක 30/15, 30/14, 30/13, 30/12 සහ අරලිය ගාඩ්න්ස් හි අයිතිකරු සොයාගත නොහැකි ඉඩම සහ ඇළ. |

09 - 492